**විෂයය**

බුද්ධ ධර්මය

**නිපුණතාව**

සාසන ඉතිහාසය හා ශ්‍රී ලංකික බෞද්ධ උරුමය හැදින එම උරුමය රැක ගැනීමට ක්‍රියා කරයි.

**නිපුණතා මට්ටම**

දළදා පුරා වෘත්තය හා දළදා පුද සිරිත් ඉගෙන එම පුද සිරිත් සුරැකීමට ක්‍රියා කරයි.

**පාඩම**

19

# සිරි දළදා අසිරිය

සැකසුම - පූජ්‍ය තාරපේරියේ ගුණරතන හිමි

**8 ශ්‍රේණිය**

**බුද්ධ ධර්මය**

**19 පාඩම**

**දළදා අසිරිය**

**i කොටස**

01.දළදා වහන්සේ පිළිබඳ ලියවුණු පැරණිම ග්‍රන්ථය වන්නේ...

1. දළදා සිරිතයි. 2. දළදා පූජාවලිය
3. පාලි දාඨාවංසය 4. දළදා වරුණයි.

02.. දළදා වහන්සේ මෙරටට වැඩම කරන ලද්දේ........

1. කිත්සිරිමෙවන් රජු දවස ය.
2. කීර්ති ශ්‍රී රාජසිංහ රජු දවසය.
3. ශ්‍රී වික්‍රම රාජසිංහ රජු දවසය.
4. ශ්‍රී විජය රජු දවසය.

03. අලුත් සහල් මංගල්‍යය සෑම වසරකම පවත්වන්නේ...

1. දුරුතු පොහොය දින ය. 2. නවම් පොහොය දින ය.
3. මැදින් පොහොය දින ය. 4. වප් පොහොය දින ය.

04. දළදා වහන්සේගේ ගිහි භාරකාරත්වය දරන්නේ .......

1. වට්ටෝරුරාල ය. 2. දියවඩන නිලමේතුමන් ය.
3. බස්නායක නිලමේ තුමන් ය 4. මල්වතු මහ නාහිමිවරුන් ය.

05. වාර්ෂිකව සිදුකරන සතර මහා දේවාල මංගල්‍යය අතුරින් උත්කර්ෂවත් ම මංගල්‍යය වන්නේ.......

1. අලුත් සහල් මංගල්‍යයයි. 2.අවුරුදු මංගල්‍යයයි.
3. ඇසළ මංගල්‍යයයි. 4. කාර්තික මංගල්‍යයයි.

06. නානුමුර කිරීම යනු .....

1. හේවිසි නාද කිරීමයි .  2. දළදා වහන්සේ ස්නානය කරවීමයි.

2. බුද්ධ පූජා පැවැත්වීමයි.  4. මාලිගාවේ දොර විවෘත කිරීමයි.

07. දළදා වහන්සේ උදෙසා දිනකට සිදු කරන පූජා ගණන කීය ද?

1. 3 කි.  2. 4 කි.  3. 5 කි.  4. 6කි.

08. කිත්සිරිමෙවන් රජු දවස මෙරටට වැඩම කරවන ලද්දේ බුදු රජාණන් වහන්සේගේ යටි හනුවේ වම් දළදාව බව.......

1. දළදා වරුණ ග්‍රන්ථයේ විස්තර කරයි .

2. දළදා පූජාවලිය ග්‍රන්ථයේ විස්තර කරයි.

3. පාලි ලලාට ධාතුවංශයෙහි විස්තර කරයි.

4. දළදා සිරිත ග්‍රන්ථයෙහි විස්තර කරයි.

09. හේමමාලා කුමරියගේ පිය රජු ලෙස ඉතිහාසයේ සඳහන් වන්නේ......

1. බ්‍රහ්මදත්ත රජුය.  2. සුනන්ද රජුය.

3. ගුහසීව රජු ය.  4. පණ්ඩුකාභය රජුය.

10. අග්‍ර උපස්ථායක ආනන්ද ආනන්ද තෙරුන්ගේ බුද්ධ උපස්ථානය සිහිපත් කොට වතාවත් සිදු කරන්නේ....

1. අලුයම පූජාවෙහි ය.  2. සවස පූජාවෙහි ය.

3. සැන්දෑ පූජාවෙහි ය.  4. මැදියම් පූජාවෙහි ය.

## ii කොටස

01. i. දළදා වහන්සේ පිළිබඳ ලියැවුණු පැරණිම ග්‍රන්ථය කුමක්ද?

ii. දළදා පුද පූජා පැවැත්වෙන කාලය අනුව ප්‍රධාන කොටස් කීයද? ඒ මොනවා ද?

iii. "අලුයම පූජාව" පිළිබඳ කෙටි විස්තරයක් ලියන්න.

02. i. දළදා ඉතිහාසය ගැන ලියවුණු ග්‍රන්ථ දෙක ලියන්න.

Ii. දළදා වහන්සේ වෙනුවෙන් සිදුකරන වාර්ෂික පුද පූජා අතුරින් තුනක් ලියන්න .

iii. ඇසළ පෙරහර ගමන් කරන පිළිවෙළ අනුව කොටස් පහකි. ඒ මොනවාද?

03.i. දළදා වහන්සේ ලංකාවට වැඩම කළේ කවුද ?

ii. වම් දළදා වහන්සේ මෙරට වැඩ සිටි ස්ථාන තුනක් නම් කරන්න.

iii. දළදා වහන්සේ වැඩමවීමේ පුරාවෘත්තය කෙටියෙන් ලියන්න.

## පිළිතුරු

## i කොටස

1. 3
2. 1
3. 1
4. 2
5. 3
6. 2
7. 1
8. 3
9. 3
10. 1

## ii කොටස

01.i. පාලි දාඨාවංසය

ii. • දෛනික පූජා හෙවත් දිනපතා පවත්වන පූජාව

• සප්තාහික පුද පූජාව හෙවත් සතියකට වරක් පවත්වන පුද පූජාව

• වාර්ෂික පුද පූජාව

iii. අලුයම 5.15 ට පමණ හේවිසි වාදනය කරයි. ඒ අනුව එය අලුයම දූරය ලෙස හැඳින්වේ. පෙරවරු 5.30 ට අලුයම තේවාව ආරම්භ වෙයි. එයට තේවාව භාර නායක ස්වාමින් වහන්සේ හා දෙවැනි ස්වාමීන් වහන්සේ ද වැඩම කරති. දළදා තේවාවට උපකාරී වන තේවාකාර ධූර කිහිපයකි.

1. වට්ටෝරුරාල
2. ගෙපරාළ
3. කත්තියන රාල
4. හක්ගෙඩි රාළ
5. පල්ලේමාලේ රාළ
6. දොරකඩ ආරච්චි

එහි දී දළදා හාමුදුරුවන් වැඩ සිටින මාලිගාවේ දොරවල් විවෘත කිරීමෙන් අනතුරුව චාරිත්‍රානුකූලව දළදා තේවාවන් රැසක් සිදු කෙරේ. අවසානයේදී එහි ප්‍රධාන කාර්යය ලෙස බුදුරජාණන් වහන්සේගේ ප්‍රධාන උපස්ථායක ආනන්ද හිමි සිදු කළ උපස්ථානය ම සිහිපත් කරගෙන තේවාවේ නියුතු ස්වාමීන් වහන්සේලා දෙනම ගෙන් එක් නමක් බුද්ධ උපස්ථානය සිදු කරයි එහිද දී ඇල් පැන්, උණු පැන්, දැහැටි දඬු, අටපිරිකර හා අවාන විජිනි පත යනාදී උපකරණ පිළිවෙලින් පූජා කෙරෙයි. තේවාව අවසන් වීමෙන් පසු මහජනතාවට දළදා වහන්සේ වන්දනා කිරීමට අවස්ථාව ලැබෙයි. අනතුරු අලුයම 6.00 ට ආහාර පූජාව පැවැත්වේ. මෙම පූජාවට හාල් සේරු 32ක බත් දානය ද, ව්‍යංජන 32ක් ද අවුල්පත් ද, සූදානම් කෙරේ. එය මුළුතැන් පූජාව ලෙස හැඳින්වෙයි.

02.i. • දාඨාවංසය

• දළදා සිරිත

• දළදා පූජාවලිය

• දළදා වරුණ

ii. • අලුත් සහල් මංගල්‍යය.

• අලුත් අවුරුදු මංගල්‍යය

• ඇසල මංගල්‍යය .

• වාර්ෂික මංගල්‍යය

iii. • දළදා මංගල්‍යය

• නාථ දේවාලයේ මංගල්‍යය

• විෂ්ණු දේවාලයේ මංගල්‍යය

• කතරගම දේවාලයේ මංගල්‍යය

• පත්තිනි දේවාලයේ මංගල්‍යය

03.i. හේමමාලා, දන්ත කුමරු

ii. පොළොන්නරුව,  යාපහුව, කුරුණෑගල, බෙලිගල, දෙල්ගමු, කෝට්ටේ

iii. * ඛේම නම් රහතන් වහන්සේ වම් දළදාව ආදාහන මළුවෙන් ගෙන කලිඟු රට දන්ත පුරයෙහි බ්‍රහ්මදත්ත රජු වෙත භාර දීම.

- රජතුමා එම දළදා වහන්සේ අනර්ඝ මන්දිරයක් ඉදිකොට එහි තැන්පත් කර පුද පූජා පැවැත්වූහ.
- ඔහු පුත් කසී රජු ද  ඉන් පසුව සුනන්ද රජුද, දළදා වහන්සේට පූජා පූජාවන් පැවැත්වූහ.
- ගුහසීව රජතුමා ද ස්වකීය රාජ පරම්පරාව අනුව යමින් දළදා වහන්සේට  අසීමිත ලෙස ගෞරවයෙන් පුද පූජා පැවැත්වූයේය.

**සැකසුම - පූජ්‍ය තාරපේරියේ ගුණරතන හිමි,**